# අර්බුද සමයකදී සිරගත නොවී වාර්තාකරණය සිදුකරන ආකාරය

කතාකිරීමේ හා අදහස් ප්‍රකාශනයේ නිදහස යනු ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද මූලික අයිතිවාසිකමකි. මෙම නිදහස පරම නැත. කෙසේ වෙතත්, මෙම නිදහස නිරපේක්ෂ නොවන අතර, මාධ්‍යයට යම් අයුරකින් බලපෑහැකි පුළුල් බලතල මේ මොහොතේ රජය තමන් වෙත පවරාගෙන සිටියි. නීතිය හා ඔබගේ ක්‍රියාකාරිත්වයෙන් ඇතිවිය හැකි ප්‍රතිඵල පිළිබඳ දැනසිටීම මගින් ඔබට දණ්ඩනයට ලක්වීමෙන් වැළකී සිටිය හැකිය. ඔබ විසින් පළකරනු ලබන අන්තර්ගතයන් හේතුවෙන් ඔබ අපරාධ වැරදිවල වගඋත්තරකරුවකු වීමේ අවදානමක් පවා තිබෙන බව ඔබ දැන සිටිය යුතුයි

**ඔබ දන්නවාද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ඔබේ දේශපාලන මතවාදයට අදාළ වන දැක්මට පවා ආරක්ෂාව හිමි වේ. පෞද්ගලික හිමිකාරීත්වය ඇති සහ පාලනය කරනු ලබන පුවත්පත්වලින් ආණ්ඩු විරෝධී ප්‍රවෘත්ති සහ දැක්ම බැහැර කිරීම හා යටපත් කිරීම සමාන සැලකීම් සඳහා තිබෙන අයිතිය උල්ලංඝනය කිරීමකි. එය වෙනස්කම් කිරීමකි.

## ඔබේ හිමිකම් අවබෝධ කරගැනීම

කතාකිරීමේ හා අදහස් ප්‍රකාශනයේ නිදහස යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයකුගේ අදහස් සහ මතවාද කතාවෙන්, ලිඛිතව, මුද්‍රණයෙන්, පිංතූර ලෙස හෝ වෙනත් ආකාරයකින් ප්‍රකාශ කිරීමේ නිදහස බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිරීක්ෂණය කරන ලදී. අදහස් මුද්‍රණයේ සහ ප්‍රචාරය කිරීමේ නිදහස ද එයට අයත් වේ (නීතිපතිට එදිරිව ජෝසප් පෙරේරා, 1992 1 SLR 19).



## මෙම අයිතිවාසිකමේ පරාසය පහත දැක්වෙන කරුණු පිළිගත හැකි අන්දමින් පුළුල් වේ.

- පුවත්පත් නිදහස
- ප්‍රවෘත්ති ලබාගැනීමේ හා වාර්තා කිරීමේ අයිතිය
- තොරතුරු සෙවීමේ හා ලබාගැනීමේ අයිතිය
- තොරතුරු සහ අදහස් සන්නිවේදනය කිරීමේ අයිතිය

## මාධ්‍ය නිදහස සීමා කළ හැකිද?

අදහස් ප්‍රකාශනයේ හා පළකිරීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නීති මගින් දක්වා තිබෙන ආකාර මගින් සීමාකළ හැකිය. ඒවා නීත්‍යානුකූල සීමාකිරීම් වන අතර කිසිදු හේතුවක් නිසා ඒවා මගහැර යා නොහැකිය.

## පහත දැක්වෙන්නේ රජයට නීත්‍යානුකූල ලෙස ප්‍රකාශනයේ නිදහස සීමාකළ හැකි අවස්ථායි.

- වාර්ගික සහ ආගමික සමගිය වෙනුවෙන්
- පාර්ලිමේන්තු වරප්‍රසාද
- අධිකරණයට අපහාස කිරීම
- අපහාස කිරීම හෝ වරදකට පෙළඹෙන පරිදි කුපිත කිරීම

පොදු පිළිවෙල සහ මහජන සෞඛ්‍යය හා ආචාරධර්ම සුරැකීම

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුබසාධනයේ සාධාරණ අවශ්‍යතා

ත්‍රිවිධ හමුදාවේ (යුද, නාවික, ගුවන් හමුදා) රාජකාරි නිසි පරිදි ඉටුකිරීමට බාධා සිදුවීම

ජාතික ආරක්ෂාව






ඔබට දැකිය හැකි ආකාරයට, කතාකිරීමේ නිදහස සම්බන්ධ මෙම ව්‍යතිරේඛයන් තරමක් පුළුල් වන අතර අර්ථ නිරූපණ සඳහා විවෘතය. මෙමගින් රජයට මාධ්‍ය සම්බන්ධයෙන් දැඩි පාලනයකට අවස්ථාව ලැබේ.

## මතක තබාගත යුතු නීති

නීති මගින් විධායකයට යම් දුරකට නම්‍යශීලීත්වයකට අවස්ථාව ලබාදෙයි. විශේෂයෙන්ම ජාතික ආරක්ෂාව සහ නීතිය බලාත්මක කිරීම සම්බන්ධ කාරණාවලදී එම අවස්ථාව ලැබේ. මෙම නීතිමය අභිමතය අවභාවිතාවට ලක්විය හැකිය. මේ සම්බන්ධයෙන් විධායකයට තිබෙන බලය නීති මගින් නිසි ලෙස අර්ථ නිරූපණය කර නොතිබීම එයට හේතුවයි. එම නිසා, රාජ්‍යයට එරෙහි ඕනෑම විරෝධතාවක් සීමාකිරීම සඳහා නීතිය භාවිතා කළ හැකිය. එය මාධ්‍ය නිදහස පැත්තෙන් නරක තත්වයකි.



USAID FROM THE AMERICAN PEOPLE
IREX

## පහත දැක්වෙන්නේ ඔබ විසින් මතක තබාගත යුතු වන වැදගත් නීති කීපයකි:

### 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක සංශෝධන ආඥාපනත සහ හදිසි නීති

මහජන ආරක්ෂක ආඥාපනත මගින් ජනාධිපතිවරයාට තමන් සිතන විට මහජන ආරක්ෂාවේ නාමයෙන් සහ පොදු පිළිවෙල ආරක්ෂා කරගැනීම සඳහාත්, ප්‍රජාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවාවන් මැනැවින් පවත්වාගෙන යාම සඳහාත් හදිසි නීති පැනවීමට බලය ලැබේ. ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත්කළ පසු, මෙම රෙගුලාසි රාජ්‍යයේ නීතිවලට ඉහළින් ක්‍රියාත්මක වන අතර කිසිදු අධිකරණයකට ඒවා ප්‍රශ්න කළ නොහැකිය.

හදිසි නීති තාවකාලික වන අතර සති දෙක හා හතර අතර කාලයක් බලපැවැත්වේ. එයට වඩා දිගු කාලයක් බලපැවැත්වීම සඳහා එම නීති මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන අනුව අලුත් කළ යුතුය. රෙගුලාසි ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව, ඒවා සියලුදෙනාට අදාළ වේ. කතාකිරීමේ හා ප්‍රකාශනයේ නිදහස සීමාකිරීමේ පුළුල් ක්‍රියාමාර්ග එහි අඩංගු වේ. ඒවා ජනමාධ්‍යයන්ට අහිතකර ලෙස බලපෑ හැකිය. හදිසි නීති රෙගුලාසි සමග අනුගත නොවීම සාපරාධී චෝදනා එල්ලවීමට හේතු වේ. 2022 මැයි 6දා හදිසි නීති ප්‍රකාශයට පත්කරන ලදී. මෙම ලේඛනය සකස් කරන දිනය වන විට හදිසි නීති බලාත්මක වන්නේ නැත.

### දණ්ඩ නීති සංග්‍රහය

සියලුදෙනාට අදාළ වන සාමාන්‍ය නීතියක් වන දණ්ඩ නීති සංග්‍රහයෙහි වැරදි සහ ඒවාට දඬුවම් අඩංගු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන තිබෙන කතා කිරීමේ හා අදහස් ප්‍රකාශනයේ නිදහස සීමා කළ හැකි 'නීත්‍යානුකූල සීමාවන්' කීපයක් දණ්ඩ නීති සංග්‍රහය විසින් නිර්දේශ කරනු ලැබේ. මාධ්‍ය නිදහස සීමාකිරීම සඳහා සුලබව භාවිතා කරනු ලබන එක් විධිවිධානයක් වන්නේ 120වන කොටසයි. එමගින් ජනාධිපතිවරයාට හෝ රජයට එරෙහිව 'කලකිරීම ඇතිකිරීම හෝ කලකිරීම ඇතිකිරීමට උත්සාහ කිරීම' වරදක් බවට පත්කරනු ලැබේ.

## අධිකරණයට අපහාස කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

'අධිකරණයට අපහාස කිරීම' සරලව ගත් කල එමගින් අදහස් කරනු ලබන්නේ අධිකරණ නියෝගයකට අවනත නොවීමයි. එමගින් අධිකරණය මැනැවින් පරිපාලනය කිරීමේ කාර්යයට බාධා කිරීමට හෝ මැදිහත් වීමට හේතු වන ඕනෑම චර්යාවක් වරදක් ලෙස අර්ථ නිරූපණය කළ හැකිය. යුක්තිය පරිපාලනය කිරීමේ පද්ධතිය සහ අධිකරණයේ ස්වාධීනත්වය කෙරෙහි මහජන විශ්වාසය ඕනෑම ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලියකදී වැදගත් යයි සැලකේ.

ඕනෑම ස්වරූපයක ඕනෑම මාධ්‍යයක් විසින් යුක්තිය පරිපාලනය සම්බන්ධයෙන් අධිකරණය කෙරෙහි තිබෙන විශ්වාසය අහිමි කිරීමේ උත්සාහයක් ලෙස සැලකිය හැකි කිසියම් මැදිහත්වීමක් සිදුකරන්නේ නම් හෝ එසේ කිරීමට උත්සාහ කරන්නේ නම්, එය 'අධිකරණයට අපහාස කිරීමේ' චෝදනාව එල්ල වීමට හේතුවක් විය හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාව මගින් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හා අභියාචනාධිකරණයට පවරනු ලැබේ.

## 1953 අංක 21 දරණ පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) සංශෝධිත පනත

'පාර්ලිමේන්තු වරප්‍රසාදවලට' අදාළව කතා කිරීමේ හා අදහස ප්‍රකාශනයේ නිදහස සීමා කළ හැකි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගනු ලැබේ. උදාහරණයක් ලෙස, පාර්ලිමේන්තුවේ කටයුතුවලට අනවශ්‍ය මැදිහත්වීමක් ලෙස සැලකිය හැකි ඕනෑම ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් දඬුවම් පැමිණවීමේ බලය පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත මගින් පාර්ලිමේන්තුව සහ ශ්‍රේෂ්ඨාධිකරණයට පවරනු ලැබේ. පාර්ලිමේන්තු විවාද නිල වශයෙන් වාර්තාගත කරනු ලබන හැන්සාඩ්වලින් ඉවත් කරන ලද කාරණයක හෝ ප්‍රකාශයක් ප්‍රසිද්ධ කිරීම සහ පාර්ලිමේන්තුවේ කාර්යයන්ට හෝ ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ මන්ත්‍රී ධුරයට අදාළ කාර්යයන් හා සම්බන්ධ කීර්තියට හෝ ක්‍රියා පටිපාටියට අපහාසාත්මක වන ප්‍රකාශනයක් හෝ අදහස් ප්‍රකාශ කිරීමක් මෙයට අදාළ වේ.

## 2007 අංක 56 දරණ ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

මෙම පනත හඳුන්වාදෙනු ලැබුවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ නීතිමය ක්‍රියාමාර්ග හරහා ක්‍රියාත්මක නොවන ජාත්‍යන්තර සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහාය. පනත විසින් නීතිය ඉදිරියේ පුද්ගලයකුගේ අයිතිවාසිකම්, සාධාරණ නඩුවිභාගයක් සඳහා හිමිකම, ළමයාගේ අයිතිවාසිකම්, පාලනයට සම්බන්ධ වීමේ හිමිකම සහ පොදු සේවා වෙත සම ප්‍රවේශයේ අයිතිය ලෙස හඳුනාගනිමින් ආරක්ෂා කරනු ලැබේ. එයට අමතරව, 'වෙනස්කොට සැලකීම, එදිරිවාදීත්වය හෝ ප්‍රචණ්ඩත්වය ඇතිකිරීමට හේතුවන, ඕනෑම ජාතියක, ජනවර්ගයක හෝ ආගමක වෛරයට' එරෙහිව ආරක්ෂාවන් එයට ඇතුළත් වේ.

## 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යනු ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදී තර්ජන සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා තාවකාලික ලෙස සලකන ලද විධිවිධානයකි. කෙසේ වෙතත්, එම පනත අත්හිටුවීමකින් හෝ අහෝසි කිරීමකින් තොරව එය තවමත් බලාත්මකව පවතී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි 2(h) කොටස සෘජුවම ජනමාධ්‍ය සහ ජනමාධ්‍යවේදීන්ට අදාළ වේ.



USAID FROM THE AMERICAN PEOPLE
IREX

## පහත දැක්වෙන්නේ සිත්හි තබාගත යුතු කාරණා කීපයකි:




ව්‍යවස්ථාව යටතේ ආරක්ෂා කරනු ලබන මූලික අයිතිවාසිකම් කිසියම් රාජ්‍ය නිලධාරියකු හෝ රාජ්‍ය ආයතනයක් විසින් බලහත්කාරෙන් සීමාකිරීම හෝ උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝග කළ හැකිය. එහෙත්, නීත්‍යානුකූල සීමාවන් අභියෝගයට ලක්කළ නොහැකිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වගන්තිය (නිදහස සහ වධහිංසනය) යනු සෑම පුද්ගලයකුටම තහවුරු කර තිබෙන පරිපූර්ණ අයිතිවාසිකමකි. කිසිදු හේතුවක් නිසා, කිසිදු ආකාරයකින් එම අයිතිවාසිකම් සීමා කළ නොහැකිය. ඉහත දක්වන ලද ආකාරයෙන් නීත්‍යානුකූල අන්දමින් පවා ඒවා සීමා කළ නොහැකිය.

ඔබගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම පිළිබඳ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කිරීමට ඔබ ද බැඳී සිටියි. එහෙත්, මෙම තීරණ බලාත්මක කිරීම දුෂ්කරය.

ඔබගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් තක්සේරු කළ හැකි වන්නේ එක් එක් සිදුවීම සම්බන්ධ පසුබිම අනුවය. සියලු සාධක ආවරණය වන පරිදි සවිස්තර නීති සම්පාදනය කිරීම දුෂ්කරය.

ඔබගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ලක්වන බව ඔබට හැඟෙන අවස්ථාවන්හිදී, කරුණාකර නීතිමය උපදෙස් හා නියෝජනය ලබාගන්න.

නීති ආධාර කොමිෂන් සභාව සහ මධ්‍යස්ථාන:
**https://www.gic.gov.lk/gic/index.php?op-
tion=com_org&Itemid=4&id=8&task=org&lang=en**

ශ්‍රී ලංකා නීතීඥ සංගමය:
**0773723823 (නීතීඥ ප්‍රසාද් පෙරේරා)**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව:
**https://www.hrcsl.lk/home/** (වෙන්කළ දුරකථන අංකය **- 1996)**

හදිසි ගිලන්රථ සේවා: වෙන්කළ දුරකථන අංකය **- 1990**

මානසික සෞඛ්‍ය සහාය සඳහා:
**CCC Foundation:** වෙන්කළ දුරකථන අංකය **- 133**

ජාතික මානසික සෞඛ්‍ය විද්‍යායතනය - NIMH
වෙන්කළ දුරකථන අංකය **- 1926**




## ඔබ අත්අඩංගුවට පත්වීමේ අවදානමෙන් ගැලවෙන්නේ කෙසේද?

ඔබ ජනමාධ්‍යවේදියෙකු නම්, මහජන විරෝධතා ස්ථානවල ආවරණ කටයුතු සිදුකරද්දී හැමවිටම ඔබගේ මාධ්‍ය හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන පරිදි පැළඳ සිටින්න.

ඔබ පුරවැසි ජනමාධ්‍යවේදියකු නම්, ප්‍රචණ්ඩ බවට පත්විය හැකිව තිබෙන ජනරාශිවලින් ඈත්වන්න.

ප්‍රචණ්ඩත්වය හෝ ප්‍රචණ්ඩත්වය ඇතිකිරීම ලෙස සැලකිය හැකි කිසිදු ශාරීරික හෝ වාචික ක්‍රියාවක නිරත නොවන්න.

කිසිදු හේතුවක් නිසා රාජකාරියේ නියුතු කිසිදු රජයේ නිලධාරියෙකුට බාධා නොකරන්න.





ඔබ අත්අඩංගුවට පත්වුවහොත් වහා දැනුම්දීම සඳහා පුද්ගලයකු සූදානම් කර තබන්න (හදිසි අවස්ථාවකදී වහා ඇමතිය හැකි පවුලේ අයෙකුගේ හෝ සගයකුගේ අංකයක් සේව් කර තබාගන්න. ඔබ අත්අඩංගුවට පත්වුවහොත්, වහා දැනුම්දීම සඳහා නීතීඥවරයකුගේ අංකයක් එම පුද්ගලයාට ලබාදෙන්න).

KeepSafe වැනි රහස්‍යභාවය සම්බන්ධ ඇප් එකක් ඔබගේ ජංගම දුරකථනයෙහි ස්ථාපිත කරගන්න. රහස්‍ය තොරතුරු හා මූලාශ්‍ර සියල්ල අවශ්‍ය අවස්ථාවලදී ඔබට ලබාගත හැකිවන අන්දමින් සහ තුන්වන පාර්ශවයකට ලබාගත නොහැකි වන පරිදි එහි ගබඩා කර තබාගන්න.

ආවරණය කරුණු මත පදනම් වන බව හැමවිටම තහවුරු කරන්න. බෙදාහරිනු ලබන තොරතුරු ඉහත දක්වන ලද 'නීතිමය' සීමාව ඉක්මවන්නේ නැති බව තහවුරු කරගැනීම සඳහා ඔබගේ අන්තර්ගතය නැවත කියවන්න. ලැයිස්තුගත කර තිබිය හැකි නීතියේ පරාමිතීන් අනුව කටයුතු කිරීමෙන් ඔබ අත්අඩංගුවට පත්වීමේ හෝ රඳවාතබාගැනීමට ලක්වීමේ අවදානම අවම කරගත හැකිය.



USAID FROM THE AMERICAN PEOPLE
IREX